
සවියෙන් පෙරට අපි එකට

e - ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 11 | භූගෝල විද්‍යාව | 2 | 04. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව |




සැකසුම: සුරංජි නිල්මිණි රොඩ්රිගෝ

බප/හො/තක්ෂිලා මහා විද්‍යාලය

# හැඳින්වීම

- රටක භෞතික හා මානුෂ ක්‍රියාවලින්ගේ අන්තර් ක්‍රියා පිළිබඳ ව පරීක්ෂා කිරීමේදී එම රටෙහි ජන සංඛ්‍යාව අවබෝධයක් ලබා සිටීම ඉතා වැදගත්ය.
- තවද කිසියම් රටක ආර්ථිකය සංවිධානය කිරීමේදී සහ ආර්ථික ප්‍රතිපත්ති තීරණය කිරීමේදී ද ජන සංඛ්‍යාව වැදගත් සාධකයකි.

# ජන සංඛ්‍යාවේ විශාලත්වය

- ශ්‍රී ලංකාවේ මිලියන 20 ට ආසන්න ජන සංඛ්‍යාවක් ජීවත්වන අතර සංවර්ධනය වෙමින් පවතින රටකි. බහු සංස්කෘතික ජන සමාජයක් හිමි රටක් ලෙස ශ්‍රී ලංකාව පෙන්වා දිය හැකිය.
- ජන සංඛ්‍යා විශාලත්වය අනුව දකුණු ආසියාතික රටවල් අතරින් ශ්‍රී ලංකාවට පස්වන ස්ථානය හිමිවේ.
- එසේම  එම රටවල් අතරින් ජන සංඛ්‍යා වර්ධන වේගය අඩුම රට ශ්‍රී ලංකාවයි.

# දකුණු ආසියාතික රටවල ජන සංඛ්‍යාව, ජන ඝනත්වය සහ වාර්ෂික වර්ධනය (2013)

| රට | ජන සංඛ්‍යාව (මිලියන) | ජන ඝනත්වය වර්ග කිලෝමීටරයට | සාමාන්‍ය වර්ධන වේගය |
|---|---|---|---|
| ඉන්දියාව | 1252 | 381 | 1.3 |
| පකිස්ථානය | 182 | 229 | 1.8 |
| බංගලාදේශය | 156 | 1087 | 1.1 |
| නේපාලය | 27 | 189 | 1.2 |
| ශ්‍රී ලංකාව | 21 | 324 | 0.8 |
| භූතානය | 0.75 | 16 | 1.9 |
| මාලදිවයින | 0.34 | 1158 | 1.8 |

# ජන සංඛ්‍යා වර්ධනය

- ජන සංඛ්‍යා  වර්ධනය යනු යම් නිශ්චිත භූමි ප්‍රදේශයක සිටින ජන සංඛ්‍යාව වැඩි වීමයි.
- රටක ජන සංඛ්‍යා වර්ධනය සිදුවනුයේ එරට උපත් අනුපාතිකය, මරණ අනුපාතිකය අභිබවා යාමත්,රටෙහි විගමනයට වඩා ආගමනය සිදුවීමත් හේතුවෙනි.
- 2012 වර්ෂයේ ශ්‍රී ලංකාවේ වාර්ෂික වර්ධන අනුපාතිකය 0.7 කි.

# ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව හා සාමාන්‍ය වාර්ෂික වර්ධන අනුපාතය


| සංගණන වර්ෂය | ජන සංඛ්‍යාව | වාර්ෂික වර්ධන අනුපාතය |
|---|---|---|
| 1871 | 2400380 | |
| 1881 | 2759738 | 1.4 |
| 1891 | 3007739 | 0.9 |
| 1901 | 3565954 | 1.7 |
| 1911 | 4106350 | 1.4 |
| 1921 | 4498605 | 0.9 |
| 1931 | 5306871 | 1.7 |
| 1946 | 6657339 | 1.5 |
| 1953 | 8097895 | 2.8 |
| 1963 | 10582064 | 2.6 |
| 1971 | 12689895 | 2.2 |
| 1981 | 14846750 | 1.7 |
| 2001 | 18797257 | 1.2 |
| 2012 | 20277597 | 0.7 |

# ජන සංඛ්‍යා වර්ධන අනුපාතය අඩු වීමට බල පෑ හේතු

1. ස්වාභාවික වර්ධනය පහළ බැසීම
2. සංක්‍රමණ

# ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය

- කිසියම් භූගෝලීය ප්‍රදේශයක් තුල ජනතාව පැතිරී ඇති ආකාරය ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය ලෙස හැඳින්වේ.
- ශ්‍රී ලංකාවේ මුළු ජන සංඛ්‍යාවෙන් 28.8% බස්නාහිර පළාත් තුල ඒකරාශී වී ඇත.
- ශ්‍රී ලංකාවේ අඩුම ජන සංඛ්‍යාවක් දක්නට ලැබෙන්නේ උතුරු පළාත තුලය. එය 5.2% කි.


Map: P2.1.2
Population by District, 2012
Legend
District Boundary
Population
90,001 - 100,000
100,001 - 500,000
500,001 - 1,000,000
1,000,001 - 1,500,000
1,500,001 - 2,000,000
2,000,001 - 2,500,000
( 1 ), ( 2 ),..........( 25 ). Indicates the District Rank of Population (least number for highest Population)
Jaffna 583,378 ( 16 )
Kilinochchi 112,875 ( 23 )
Mullaitivu 91,947 ( 25 )
Mannar
Mannar 99,051 ( 24 )
Vavuniya 171,511 ( 22 )
Anuradhapura 856,232 ( 8 )
Trincomalee 378,182 ( 21 )
Puttalam 759,776 ( 12 )
Polonnaruwa 403,335 ( 20 )
Batticaloa 525,142 ( 17 )
Kurunegala 1,610,299 ( 3 )
Matale 482,229 ( 18 )
Kandy 1,369,899 ( 4 )
Ampara 648,057 ( 14 )
Gampaha 2,294,641 ( 2 )
Kegalle 836,603 ( 9 )
Nuwara Eliya 706,588 ( 13 )
Badulla 811,758 ( 10 )
Indian Ocean
Colombo 2,309,809 ( 1 )
Moneragala 448,142 ( 19 )
Kalutara 1,217,260 ( 5 )
Ratnapura 1,082,277 ( 6 )
Hambantota 596,617 ( 15 )
Galle 1,058,771 ( 7 )
Matara 809,344 ( 11 )
Location
0 10 20 40 60 Kilometers
N
S
E
W
10°0'0"N
9°0'0"N
8°0'0"N
7°0'0"N
6°0'0"N
80°0'0"E
81°0'0"E
82°0'0"E

# ශ්‍රී ලංකාවේ පළාත් අනුව ජන සංඛ්‍යා ව්‍යාප්තිය.


| පළාත | ජන සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| බස්නාහිර | 5837264 | 28.8 |
| මධ්‍යම | 2556774 | 12.6 |
| දකුණු | 2465626 | 12.2 |
| උතුරු | 1060023 | 5.2 |
| නැගෙනහිර | 1547377 | 7.6 |
| වයඹ | 2372185 | 11.7 |
| උතුරු මැද | 1259421 | 6.2 |
| ඌව | 1259419 | 6.2 |
| සබරගමුව | 1919478 | 9.5 |
| ශ්‍රී ලංකාව | 20277597 | 100 |

# ජන ඝනත්වය


- ජන ඝනත්වය යනු කිසියම් භූමි ප්‍රදේශයක වර්ග ප්‍රමාණයක් තුළ ජීවත්වන පුද්ගලයින් සංඛ්‍යාවයි.
- සාමාන්‍යයෙන් වර්ග කිලෝමීටරයක් තුළ ජීවත්වන ජන සංඛ්‍යාව ජන ඝනත්වය ලෙස සැලකේ.
- රටේ මුළු ජන සංඛ්‍යාව එරට මුළු වර්ග ප්‍රමාණයෙන් බෙදීමෙන් ජන ඝනත්වය සොයනු ලැබේ.
- ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ජන ඝනත්වය වර්ග කිලෝමීටරයට පුද්ගලයින් 323යි.


# ජන සංයුතිය

**Ethnic composition (2012)**




**Religious affiliation (2012)**




Sri Lanka age breakdown (2018)* **
30%
25%
20%
15%
10%
5%
0%
Percentage
25.2%
23.2%
21.6%
17.5%
9.6%
2.7%
under 15
15–29
30–44
45–59
60–74
75 and over
Age (range)
© Encyclopædia Britannica, Inc.
*Provisional.
**Percentage total does not add to 100 because of rounding.

# ජන සංඛ්‍යා ව්‍යුහය

- ජන සංඛ්‍යාවක් උපතින්ම උරුම කර ගන්නා වයස් ව්‍යුහය සහ පුමිතිරි බව වැනි ලක්ෂණ ජන සංඛ්‍යාවක ව්‍යුහාත්මක ලක්ෂණ ලෙස හැදින්වේ.
- වයස් කාණ්ඩඅනුව ජන සංඛ්‍යාව -:

| | |
|---|---|
| වයස අවුරුදු 15ට අඩු | -25.8% |
| වයස අවුරුදු 15-59 | -62.0% |
| වයස අවුරුදු 60 ට | -12.2% |

- පුමිතිරි බව අනුව ජන සංඛ්‍යාව -:

| | |
|---|---|
| පුරුෂ | - 48.5% |
| ස්ත්‍රී | -51.5% |

# ජන සංඛ්‍යා ව්‍යුහයේ සුවිශේෂී ලක්ෂණ

1. බාල වයස් කාණ්ඩ වලට අයත් ජන සංඛ්‍යාව ක්‍රමයෙන් අඩුවීම.
2. වියපත් ජන සංඛ්‍යාව වැඩිවීම.
3. උපත අනුපාතය ක්‍රමයෙන් අඩුවීම.
4. ආයු අපේක්ෂාව වැඩිවීම
5. ශ්‍රම බලකාය අඩුවීම.
6. ස්ත්‍රීන් සංඛ්‍යාව වැඩිවීම.

**සවියෙන් පෙරට අපි එකට**
**e - ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 11 | භූගෝල විද්‍යාව | 2 | 04. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව - ඇගයීම |

**සැකසුම: : සුරංජි නිල්මිණී රොඩ්රිගෝ**

**බප/හො/ තක්ෂිලා මහා විද්‍යාලය**

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1) ජන සංඛ්‍යාව යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්ද ?
2) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව පිළිබඳ විධිමත් දත්ත එක්රැස් කරන ආයතනය කුමක්ද ?
3) ජන සංගණනයක් පවත්වන්නේ වසර කීයකට වරක්ද ?
4) වර්තමානයේ ශ්‍රිලංකාවේ ජන සංඛ්‍යාව කොපමණද?
5) ජන ඝනත්වය යන්න හඳුන්වා , වර්තමාන ශ්‍රී ලංකාවේ ජන ඝනත්වය කොපමණදැයි ලියා දක්වන්න ?
6) ජන සංඛ්‍යා වර්ධනය යනු කුමක්ද?
7) ශ්‍රී ලංකාවේ වර්තමාන ජන සංඛ්‍යා වර්ධන අනුපාතය කොපමණද?
8) ජන සංඛ්‍යා වර්ධනයට බලපාන සාධක දෙකක් ලියන්න .
9) ලංකාවේ අඩුම හා වැඩිම ජනසංඛ්‍යාවක් ජීවත්වන දිස්ත්‍රික්ක මොනවාද ?
10) ජන ගහන ව්‍යාප්තිය යනු කුමක්ද ?
11) ජනගහනය අසම ලෙස ව්‍යාප්ත විමට බලපාන සාධක තුනක් ලියන්න ?
12) ජන සංඛ්‍යා ව්‍යුහය යනු කුමක්ද ?
13) ජන සංඛ්‍යා ව්‍යුහයේ සුවිශේෂී ලක්ෂණ දෙකක් ලියන්න .
14) පුමිතිරිබව යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්ද ?
15) ජන සංඛ්‍යා වියපත් වීම යනු කුමක්දැයි හඳුන්වා , එයින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන බලපෑම් තුනක් ලියන්න .

**සවියෙන් පෙරට අපි එකට**
***e* - ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| **11** | භූගෝල විද්‍යාව | **2** | **04.** ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව - පිළිතුරු |

**සැකසුම: : සුරංජී නිල්මිණී රොඩ්රිගෝ**
**බප/හො/ තක්ෂිලා මහා විද්‍යාලය**

1) ජනගහනය යනු කිසියම් භූමි ප්‍රදේශයක් තුල ජීවත්වන මුළු ජන ප්‍රමාණයයි.
2) ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින්
3) වසර 10 වරක්
4) මිලියන 21 (2012)
5) ජන ඝනත්වය යනු කිසියම් රටක කිසියම් භූමි ප්‍රදේශයක වර්ග ප්‍රමාණයක් තුල ජීවත්වන පුද්ගලයින් සංඛ්‍යාවයි.වර්තමාන ශ්‍රී ලංකාවේ ජන ඝනත්වය වර්ග කිලෝ මීටරයට 323 කි.
6) කිසියම් කාල පරිච්ඡේදයක් තුලදී රටක භූ ප්‍රදේශයක සිටින ජන සංඛ්‍යාවේ වැඩිවීම ජන සංඛ්‍යා වර්ධනය ලෙස හැදින්වේ.
7) 0.7 කි.
8) උපත අනුපාතිකය, මරණ අනුපාතය ඉක්මවා යෑම, රටේ විගමනයට වඩා ආගමනය සිදුවීම.
9) වැඩිම - කොළඹ දිස්ත්‍රික්කය අඩුම - මුලතිවු දිස්ත්‍රික්කය.
10) ජන ගහන ව්‍යාප්තිය යනු කිසියම් භූමි ප්‍රදේශයක් තුල ජනගහන පැතිරී ඇති ආකාරයයි.
11) දේශගුණය ,යටිතල පහසුකම් ,භූ විෂමතාව
12) ජනගහන ව්‍යහය යනු ජන සංඛ්‍යාවක් උපතින්ම උරුම කර ගන්නා වයස් ව්‍යුහය සහ පුමිතිරි බව වැනි ලක්ෂණ ජන සංඛ්‍යාවක ව්‍යුහාත්මක ලක්ෂණ ලෙස හැදින්වේ.

13) බාල වයස් කාණ්ඩ වලට අයත් ජන සංඛ්‍යාව ක්‍රමයෙන් අඩුවීම.

වියපත් ජන සංඛ්‍යාව වැඩිවීම.

උපත අනුපාතය ක්‍රමයෙන් අඩුවීම.

ආයු අපේක්ෂාව වැඩිවීම

ශ්‍රම බලකාය අඩුවීම.

ස්ත්‍රීන් සංඛ්‍යාව වැඩිවීම.

14) පුමිතිරි බව යනු කිසියම් රටක ජන සංඛ්‍යාව ස්ත්‍රී පුරුෂ වශයෙන් බෙදීගොස් ඇති ආකාරයයි.

15) ජන සංඛ්‍යාව වියපත් වීම යනුවෙන් හැඳින්වෙන්නේ වැඩිහිටි වයස් කාණ්ඩයට (අවුරුදු 65 වැඩි ) අයත් ජන සංඛාව වැඩිවීම මත, බාල හෙවත් ළමා වයස් කාණ්ඩයට (0-14) අයත් ජන සංඛ්‍යාව අඩුවීමත්ය.

a. රට තුල ආදායම බෙදීයාමේ විෂමතා ඇතිවීම.
b. සෞඛ්‍ය සේවා සහ සැපයීම ප්‍රමාණවත් නොවිය හැකිය.
c. වැඩිහිටි පුරවැසියන් සඳහා සමාජ සුරක්ෂිත තාව ඇතිකිරීම අසිරු වීම .